// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1870/25 – 2014 ජූලි 09 වැනි බදාදා – 2014.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, ඉහල බියන්විල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/ඒ/88/35 හා 1988.10.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.552 ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 1 – ගොරකගහවත්ත හෙවත් පැෂන්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.552 ක් පමණ

උතුරට: දෙපා ඇළ; නැගෙනහිරට: දෙපා ඇළ සහ පී. ජේම්ස් පෙරේරා හිමිකම් කියන බුළුගහවත්ත; දකුණට: පී. ජේම්ස් පෙරේරා හිමිකම් කියන බුළුගහවත්ත සහ ඉහල බියන්විල පොදු සුසාන භූමිය; බටහිරට: ඉහල බියන්විල පොදු සුසාන භූමිය සහ දෙපා ඇළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2007/වීඊ/351.
2014 මැයි මස 13 වැනි දින.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 724


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*